අද 2016 11.07

# රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවා නියුක්තිය පිළිබඳ සංගණනය නොවැම්බර් 17 දා



**ෂමිල පෙරේරා**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබන රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවා නියුක්තිකයන් පිළිබඳ සංගණනය 2016 නොවැම්බර් මස 17 වැනි දින දිවයින පුරා පැවැත්වෙන බව එම දෙපාර්තමේන්තුව පවසයි. සාමාන්‍යයෙන් වසර හතරකට වරක් පැවැත්වෙන මෙම සංගණනය මෙවර පවත්වනු ලබන්නේ එකොළොස් වැනි වරටය.

ඒ අනුව, තොරතුරු රැස්කිරීමේ කටයුතු සාර්ථකව ඉටුකර ගැනීම සඳහා මෙම සංගණනය සියලුම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ සහභාගීත්වයෙන් 2016 නොවැම්බර් මස 17 වැනි දින පෙ.ව. 9:30ත් පෙ.ව.11:30ත් දක්වා කාලය තුළ සිදුකරන බව ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව නිවේදනය කරයි.

රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන් පිළිබඳ සංගණනයේ සියලු තොරතුරු ඇතුළත් වෙබ් පිටුවක් එම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය වන www.statistics.gov.lk හි ඇතුලත් කොට ඇති අතර, එහි සංගණනය සඳහා භාවිත කරන ලේඛනවල (ප්‍රශ්නාවලි, උපදෙස්, කේත ලැයිස්තු ආදී) පිටපත් සහ සංගණන ප්‍රශ්නාවලියේ සියලුම ප්‍රශ්න පිරවීම සඳහා උපදෙස්, ශ්‍රව්‍ය හා දෘශ්‍ය මාධ්‍යවලින්, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් ඇතුලත් කොට ඇති බව දෙපාර්තමේන්තුව වැඩිදුරටත් දැනුම් දෙයි.

සංගණනය පිළිබඳව එහි ඇතුලත් කොට ඇති අදාළ තොරතුරු සංගණන දිනට පෙර පරිශීලනය කොට 2016 නොවැම්බර් මස 17 වැනි දින පෙ.ව. 9:30ත්, පෙ.ව.11:30ත් දක්වා කාලය අතරතුරදී සංගණන ප්‍රශ්නාවලිය නිවැරදිව සම්පූර්ණ කොට මෙම සංගණනය සාර්ථක කරගැනීමට සහාය වන ලෙස ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සියලුම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවා නියුක්තිකයන්ගෙන් ඉල්ලා සිටී.